2009 අගෝස්තු

2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ නොලබන ව්‍යාපාරයක් වූ සංගමයක පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

1. මෙම සංගමයේ ප්‍රධාන අදායම් මාර්ගය වනුයේ සාමාජික මුදල්ය.
2. එක් අයෙකුගේ සාමාජික මුදල රු.500කි
3. 2008/4/1 දිනට හිගහිටි හා කලින් ලද සාමාජික මුදල් පිළිවෙලින් රු.6 000 හා රු.3 000ක් විය.
4. වර්තමාන වර්ෂය සඳහා සාමාජිකයන් 540 දෙනෙකු සාමාජික මුදල් ගෙවන ලදී.මෙයට අමතරව සාමාජිකයන් 10 දෙනෙකු පසුගිය වර්ෂයේ හිග මුදල් ගෙවූ අතර , වර්තමාන වර්ෂය ආරම්භයේදී සාමාජිකයන් 2 නෙකු පසුගිය වර්ෂයේ හිග මුදල් නොගෙවා ම සංගමය හැර ගොස් තිබිණි.
5. සාමාජිකයන් 5 දෙනෙක් ඊලග වර්ෂය සඳහාද සාමාජික මුදල් ගෙවන ලදී.
6. ලිපිලේඛන වලට අනුව 2009 මාර්තු 31 දිනට සිටි සාමාජිකයන් සංඛ්‍යාව 550කි.සාමාජිකයකු සංගමයට ඇතුලත් වන වර්ෂයේදී සම්පූර්ණ වර්ෂයක සාමාජික මුදල එම වර්ෂයේ අදායම ලෙස සලකනු ලැබේ.

අවශ්‍ය වන්නේ

2009/3/31 දිනෙන් අවසන් වර්ෂයේ √ 1. සාමාජික මුදල් ගිණුම

2. හිග හිටි සාමාජික මුදල් ගිණුම

3. කලින් ලද සාමාජික මුදල් ගිණුම

9

2007 අප්‍රේල්

ලාභ නොලබන සංවිධානයක් වන "දිරිය පදනම" 2006/4/1 දින පිහිටුවන ලදී. පහත සඳහන් තොරතුරු එහි පොත්වලින් උපුටා ගන්නා ලදී.

(රු.'000 )

| | |
|---|---|
| ලද මුදල් පරිත්‍යාග | 2 000 |
| රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පරිත්‍යාග කළ මෝටර් රථයේ වෙළඳපොල අගය | 1 500 |
| ගංවතුර සහනාධාර සඳහා එකතු කළ මුදල් | 1 500 |
| වියලි ආහාර මලු 1 000 ක් ණයට ගැනුම් | 500 |
| වියලි ආහාර සැපයුම්කරුවන්ට ගෙවූ මුදල් | 300 |
| වියලි ආහාර බෙදා හැරීමේදී දැරූ පරිපාලන වියදම් | 50 |
| ගංවතුර ආපදාවන්ට ලක්වූ පවුල්වලට ගෙවූ මුදල් සහනාධාර | 500 |
| සංගීත ප්‍රසංගයේ ප්‍රවේශ පත් අලවියෙන් ලද මුදල් | 1 200 |
| ගායක ගායිකාවන්ට ගෙවූ මුදල් | 400 |
| ප්‍රවේශ පත් මුද්‍රණය සඳහා ගෙවූ මුදල් | 30 |
| ප්‍රවේශ පත් මුද්‍රණය සඳහා අනුග්‍රාහකයින්ගෙන් ලද මුදල් | 50 |
| සංදර්ශනය සඳහා ගෙවූ විදුලිය හා වෙනත් වියදම් | 165 |
| කාර්යාල සේවකයින්ට ගෙවූ වේතන | 250 |
| මෝටර් රථ රක්ෂණය හා නඩත්තු සඳහා මුදල් ගෙවීම | 150 |

අතිරේක තොරතුරු

1.ගංවතුර ආපදාවන්ට ලක් වූ පවුල් සඳහා ආහාර මළු500ක් බෙදාදෙන අතර තවත් ආහාර මළු 100 ක් නැති වීඇති බව අනාවරණය විය.

2. 2007/1/1 දින මසකට රු.10 000 ක වේතනයක් මත රියදුරෙක් බඳවා ගන්නා ලදී. ඔහුගේ වේතනය මසක හිගයක් සහිතව ගෙවනු ලැබේ.

3. 2007/3/31 දින මෝටර් රථය අනතුරකට ලක්වූ අතර රක්ෂණ සමාගම මුළු වන්දි මුදල වූ රු.50 000 අනුමත කළ අතර එදිනම ඉන් 50%ක් ගෙවන ලදී.

4. 2007/3/31 දිනට නොගෙවූ ගබඩා කුලී රු. 30 000 කි.

5. ගංවතුර සහනාධාර මුදල් වලින් පාවිච්චි නොකරන ලද මුදල් වෙනම අරමුදලකට මාරු කිරීමට තීරණය කළ අතර එයට සමාන මුදලක් ස්ථාවර තැන්පතුවක 2007/3/31 වෙනි දින තැන්පත් කරන ලදී.

6.මෝටර් රථ ක්ෂය නොසලකා හරින්න

අවශ්‍ය වන්නේ

1 සංගිත ප්‍රසංග ගිණුම

2 ගංවතුර සහනාධාර ව්‍යපෘති ගිණුම

3 2007/3/31 න් අවසන් වර්ෂය සඳහා අදායම් හා වියදම් ගිණුම

4 2007/3/31 දිනට ශේෂ පත්‍රය